හොඳ සිංහල

වි ක ධර්මබන්ධු

අප කිසිදාක දැක නැති මිනිසකු හා කිඹුලකු ගැන කියන විට අප බාවිතා කරන්නේ මිනිසෙක්/මිනිසකු සහ කිඹුලෙක්/කිඹුලකු යන පදය්. උක්ත රූපය සඳහා 'එක්' ප්‍රත්‍යයත් අනුක්ත රූපය සඳහා 'අකු' ප්‍රත්‍යයත් යෙදෙන බව අපි දනිමු. ඒ පුරුස ලිංග පදවලටය්. ඒ අනියම් විදිය යනුවෙනි, හැඳින්වෙන්නේ.

එබඳු ගැහැනියක හා මැහැල්ලක ගැන කියන විට උක්ත රූපය සඳහා 'අක්' ප්‍රත්‍යය එකතු කොට ගැහැනියක් සහ මැහැල්ලක් යනුවෙන් ද අනුක්ත රූපය සඳහා ගැහැනියක හා මැහැල්ලක යනුවෙන් ද අපි ලියමු. ඒත් අනියම් විදියය්.

මිනිසා, කිඹුලා සහ ගැහැණිය, මැහැල්ල යනු අප දැක පුරුදු හෙවත් දන්නා කියන අය ගැන කියන නියම විදියය්.

1.1. මිනිහෙක් කිඹුලකු මැරිය.
1.2. මිනිහා කිඹුලා මැරිය - යන වැකි දෙකේත්
2.1. කිඹුලෙක් මිනිසකු මැරිය.
2.2. කිඹුලා මිනිසා මැරිය යන - වැකි දෙකේත් ඇත්තේ එකිනෙකට වෙනස් හතර විදියක තේරුම් බව ඔබ දනිතැය් සිතමි

වාක්‍යයක මුලට කර්තෘත් අගට ආක්‍යාතයක් ලිවීම අපේ බාසාවේ සම්ප්‍රදායය්.

3.1. ගැහැනියක් මැහැල්ලක නෑවූහ
3.2. ගැහැනිය මැහැල්ල නෑවූහ - යන වැකි දෙකේත්
4.1. මැහැල්ලක් ගැහැනියක නෑවූහ
3.2. මැහැල්ල ගැහැනිය නෑවූහ යන වැකකි දෙකත් ඇත්තේ එබඳුම හතර විදියක තේරුම්ය.

ඉතිරි ලිංග ඒක වචන අතීත කාල අක්‍යාතය සඳහාත් බහුවචන අක්‍යාතයක් යෙදීම අපේ බාසාවේ පිලිගත් සම්ප්‍රදායය්. (ගැහැනියක් නෑවූහ)

ඒ අනුව, දැරිය/දැරියක් හඬය්/හැඬූහ

දැරියෝ හඬති/හැඬූහ යනු නිවැරදි වැකකි ලෙස පිලිගැනේ. මේ ගැන නොදන්නා බොහෝ දුහුනන් ලියන්නේ දැරිය/දැරියක් හඬය්/හැඬූහ. 'හැඬූවාය' යනු ආක්‍යාතය නොවේ; නාම ක්‍රියාවය්.

(හඬය්) හඬන්නේය/හඬන්නීය
(හැඬීය) හැඬූවේය/හැඬූවාය
(හඬති) හඬන්නෝය
(හැඬූහ) හැඬූවෝය යනුවෙනි නාම ක්‍රියා වර නැගෙන්නෙ.

සුද්ද ආක්‍යාතය නොදන්නා බොහෝ දෙනා එබඳු තැන්වලදී නාම ක්‍රියාවක් යොදා ඇඟ බේරා ගන්නා බව පෙනේ. වැරදි පදයක් නොලියා එසේ ලිවීම වරදක් නොවේ.

උක්තය මුලට ලිවීමේ සම්ප්‍රදායට අනුව,

1.1. මිනිහෙක් කිඹුලකු මැරිය/මැරුවේය.
1.2. මිනිහෙක් කිඹුලෙක් ,, / ,,
1.3. මිනිහෙකු කිඹුලක් ,, / ,,
1.4. මිනිහෙකු කිඹුලකු ,, / ,,
2.1. කිඹුලෙක් මිනිහෙකු ,, / ,,
2.2. කිඹුලක් මිනිහෙක් ,, / ,,
2.3. කිඹුලෙකු මිනිහෙක් ,, / ,,
2.4. කිඹුලකු මිනිහෙකු ,, / ,, යන අටම අපට තේරුම් ගත හැකිය. එහෙත් පිලිගත් සම්ප්‍රදාය අනුව නිවැරදි ලෙස සැලකෙන්නේ 1.1. සහ 2.1. යන වැකකි දෙක පමනි. එසේම,

1.1. ගැහැනියක් මැහැල්ලක නෑවූහ/ නෑවූවා ය.
1.2. ගැහැනියක් මැහැල්ලක් ,,
1.3. ගැහැනියෙක් මැහැල්ලෙක් ,,
1.4. ගැහැනියක් මැහැල්ලකු ,,
1.5. ගැහැනියකු මැහැල්ලෙක් ,,
1.6. ගැහැනියකු මැහැල්ලකු ,,

මේ වැකකි හයෙන් කියන්නට තනන අදහස අපට තේරේ. එහෙත් එහි ඇත්තේ එක්ම එක් නිවැරදි වැකියකි. එනම් 1.1.ය.

කිසියම් උවමනාවක් නිසා (විශේෂයෙන් පද්‍යයක් ලිවීමේ දී - තාලය හෝ එලිවැට රැකීම සඳහා) වැකියක පද මාරු කොට ලිවීමට සිදු වේ.

1.1. මිනිහා (මිනිහා විසින්) කිඹුලා මැරිය (මරන ලදී)
1.2. මිනිහා (මිනිහා විසින්) මැරිය (මරන ලදී) කිඹුලා
1.3. මැරිය (මරන ලදී) මිනිසා (මිනිසා විසින්) කිඹුලා
2.1. කිඹුලා (කිඹුලා විසින්) මිනිහා මැරිය (මරන ලදී)
2.2. කිඹුලා (කිඹුලා විසින්) මිනිහා මැරිය (මරන ලදී) මිනිසා
2.3. මැරිය (මරන ලදී) කිඹුලා (කිඹුලා විසින්) මිනිහා

අනුක්ත කර්තෘ ලඟටම 'විසින්' නිපාතය යෙදෙන නිසා, මරන ලදී කිඹුලා, මිනිසා විසින් යන වැකියත් මරන ලදී මිනිසා කිඹුලා විසින්, යන වැකියත් යන දෙවැකියම නිවැරදිය.

වචන තුනක වාක්‍යක් මෙසේ 6 විදියකට ලිවිය හැකිය. "මිනිහා" මුලට යොදා ඇති වාක්‍ය තුනෙන් කියන්නේ 'මැරුනේ කිඹුලා බවය'. 'කිඹුලා' මුලට යොදා ඇති වාක්‍ය තුනෙන් කියන්නේ 'මැරුනේ මිනිසා බව' ය.

මේ වැකි නිවැරදිව අපට තේරුම් ගත හැක්කේ මුලට කර්තෘත් දෙවනුව කර්මයත් ලිවීමේ සම්ප්‍රදාය නිසාය.

ඉංග්‍රීසියේ The man killed the croc සහ The croc killed the man යන වැකිදෙක මෙසේ තැන් මාරු කොට ලිවිය හැකිදැය් බලන්න.

මා කුඩා අවදියේ කියවූ පොතක තිබූ 'පොයමක' '...Barefooted came the beggar maid - before the king kophitua (කොෆිටුආ) යන අග දෙපදය මට තාම මතකය. එහි පද 'තැන්පත් කල විට' The barefooted beggar maid came before the king kophitu යනුවෙන් වෙතියි සිතමි. මෙහි පද මාරුව වෙනත් විදිවලටද කල හැකි යයි සිතමි.

ගිරා සන්දේසයේ දැක්වෙන ('යහ' විරිතින් කියා ඇති) මේගීයපදාවලියක්ලෙසලියූවිටපෙනෙන්නේ,

'යහ අකුරු - මියුරු තෙපුලෙන් - සව් ලෙව් හදන් හදනා - නන් වන් - රුවන් රූ වන්- කිර රද සඳ - සැරදෙ' යන විදියට ය්.

නියම විදියට ලියූ නාමයක උක්ත රූපයත් අනුක්ත රූපයත් එකක්ම වන නිසා ඇති වන පැටලිල්ල අනියම් විදියේ දී ඇති නොවන්නේ එහි උක්ත රූපයත් අනුක්ත රූපයත් එකිනෙකට වෙනස් නිසාය.

<u>නියම් විදිය :</u>
පුරුස ලිංග - මිනිහා, කිඹුලා - 'ආ'
ඉතිරි ලිංග - ගැහැනිය, මැහැල්ල - 'අ'
නපුංසක ලිංග - ගස, මල - 'අ'
<u>අනියම් විදිය:</u>
පුරුස ලිංග - මිනිහෙක්, කිඹුලෙක් - 'එක්'
ඉතිරි ලිංග - ගැහැනියක්, මැහැල්ලක් - 'අක්'
නපුංසක ලිංග - ගසක්, මලක් - 'අක්'
<u>අනියම් විදිය:</u>
පුරුස ලිංග - මිනිහෙකු, කිඹුලෙකු - 'අකු'
ඉතිරි ලිංග - ගැහැනියක, මැහැල්ලක - 'අක'
නපුංසක ලිංග - ගසක්, මලක් - 'අක්'

නපුංසක ලිංග ඒක වචනයක් උක්ත වූ විටත් අනුක්ත වූ විටත් එක්ම විබක්ති ප්‍රත්‍යය 'අක්' ගන්නා බවත්, ඉතිරි ලිංග ඒකවචනයක් උක්ත වූ විට 'අක්' ප්‍රත්‍යයත් අනුයුක්ත වූ විට 'අක' ප්‍රත්‍යයත් ගන්නා බවත් පෙනේ.

පුරුස ලිංග ඒක වචනයක් උක්ත වූ විට 'එක්' පත්‍යය ගන්නා බවත් අනුක්ත වූ විට 'අකු' ප්‍රත්‍යය ගන්නා බවත් පෙනේ. සම්භරුන් මිනිසෙකු, කිඹුලෙකු යනුවෙන් 'එකු' ප්‍රත්‍යයක් ලියන බව පෙනේ.

1.1. මිනිසෙක් කිඹුලකු මැරිය
1.2. මිනිසෙක් මැරිය කිඹුලෙකු
1.3. කිඹුලෙකු, මිනිසෙක් මැරිය
1.4. කිඹුලෙකු මැරිය, මිනිසෙක්
1.5. මැරිය මිනිසෙක් කිඹුලෙකු
1.6. මැරිය කිඹුලෙකු මිනිසෙක් යන වැකි 6 ම තේරුම් ගැනීම සඳහා උක්ත රූපයත් අනුක්ත රූපයත් පිහිට කොට ගැනීමට අපට සිදු වේ.

1.1. ගැහැනියක් මැහැල්ලක නෑවූහ.
1.2. ගැහැනියක් නෑවූහ, මැහැල්ලක.
1.3. මැහැල්ලෙක ගැහැනියෙක් නෑවූහ
1.4. මැහැල්ලක නෑවූහ, ගැහැනියක්.
1.5. නෑවූහ ගැහැනියක් මැහැල්ලෙක.
1.6. නෑවූහ මැහැල්ලක, ගැහැනියක් යන වැකි 6 තේරුම් ගැනීමට ද පිහිට වන්නේ 'ප්‍රත්‍යයන්' ය.

1.1. (අඹ) ගසක් ගෙඩියක් (බිම) හලය්.
1.2. ගසක් හලය් ගෙඩියක්.
1.3. ගෙඩියක් හලය් ගසක්.
1.4. ගෙඩියක් ගසක් හලය්.
1.5. හලය් ගසක් ගෙඩියක්.
1.6. හලය් ගෙඩියක් ගසක්. උක්තයටත්

අනුක්තයටත් එකම විබක්ති ප්‍රත්‍යය ඇති නපුංසක ලිංග වාක්‍ය, 6 අප තේරුම් ගන්නේ 'ගෙඩියකට ගසක් බිම හෙළීම නොකල හැකි නිසා ය.

මිනිහෙක් මහල්ලෙක් නෑව්වා (නෑවීය)
ගැහැනියෙක් කෙල්ලෙක් නෑව්වා (නෑවූහ)
ගැහැනියෙක් කෙල්ලෙකු නෑව්වා (නෑවූහ)
ගැහැනියක් කෙල්ලක් නෑව්වා (නෑවූහ)
මිනිහෙකු මහල්ලෙක් නෑව්වා (නෑවීය)
ගැහැනියෙකු කෙල්ලෙක් නෑව්වා (නෑවූහ)

වැනි වාක්‍ය ද ඉඳ හිට අපට දක්නට ලැබේ. මේ සදොස් වහර දවසින් දවස පැතිර යනු දකින විට අපේ වියරනය සැත් කමකට බාජන විය යුතු යය් සිතේ. ඒ පිලිබඳ ව අදහස් දැක්වෙන තුන්වන ලිපිය මීලඟ කලාපේ.

ඒ සඳහා,

මිනිසෙක් දිය පීනා යෙය් එතරට
ඇඟනක් දිය පීනා එය් මෙතරට
පහරක් දුන සරනින් ඔහු සිරසට
අනෙකක් හැඬුවා එ සඳෙහි දුරසිට

ඇඟනක් පිය ගෑ ලතු සිරසෙහි වැකි
මිනිසෙකු ගඟ දිය කෙලියෙන් නොවැලකි
අනෙකක් ඇස රතු විය ලතු නොම වැකි
ඇයසක එතරට වෙන දිය කරනෙකි

යන හංස සන්දේශයේ පද්‍ය දෙක පාදක කර ගනිමි.

සුභාෂිතයෙන්....

පැනසර නොවන නිරිඳුන් ලද රජ සැපතු
ගොරතර නිරා දුකටත් වැඩියෙන් විපත
තිරසර නැනැති නරවර ලද එම සැපතු
සුරපුර සැපතුටත් සිය ගුනෙනි යහපත

<u>පදාවලිය</u>
පැනසර නොවන
නිරිඳුන් ලද
රජ සැපත
ගොරතර
නිරා දුකටත් වැඩියෙන්
විපතක් ය
තිරසර
නැනැති
නරවරුන්
ලත් එම සැපතම
සුර (පුර) සැපතුටත්
සිය ගුනයකින්
යහපත් වේ.

<u>අදහස</u>
ප්‍රඥාසාර නොවූ (මෝඩ) රජවරුන් ලබුවා වූ රජකම ඉතා බියකරු අපා දුකටත් වැඩි විපතකි. බලවත් නුවනැති රජවරුන් ලබුවා වූ රජකම දෙව්ලෝ සැපතටත් වඩා සිය ගුනයෙන් යහපත් ය.

<u>විස්තරය</u>
මොඩයකු රජ වූ විට, එය ඔහුටත් රටටත් මහා විපතකට හේතු වේ. ඔහු කල යුතු දේ නොකරයි. නොකල යුතු දේ කරයි. එවිට රට පිරිහේ. නැනවතකු රජ වූ විට එය ඔහුටත් රටටත් සැපතකි රටට කිරි පැනි උතුරයි. සුර සැප මිනිස් ලොව සැපතට වඩා බොහෝ ඉහත බව සුර ලොව සිට පැමිනි ඇත්තෝ කියති.

වි. ක. ධර්මබන්දු